# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
10 ශ්‍රේණිය

4 වන පාඩම

## ගිණුම්කරණය හැඳින්වීම

### ගිණුම්කරණය නිර්වචනය

ගිණුම්කරණය යනු ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශ්වවල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලියයි. ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු වැදගත් වන අතර එම තොරතුරු සැපයීමට පවතින ගිණුම්කරණය, මූල්‍ය ගිණුම්කරණය ලෙස හැඳින්වේ.

### ගිණුම්කරණයේ අරමුණු හා අවශ්‍යතාව

ගිණුම්කරණයේ ප්‍රධානම අරමුණ වන්නේ ව්‍යාපාරය පිළිබඳ ඇල්මැති පාර්ශ්වවලට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමයි. ඇල්මැති පාර්ශ්වයන් ලෙස අයිතිකරුවන්, කළමණාකරුවන්, ගනුදෙනුකරුවන්, රජය ආදිය දැක්විය හැක. මෙම ප්‍රධාන අරමුණ මත පදනම්ව පහත සඳහන් වෙනත් අරමුණු ගණනාවක් හඳුනාගත හැක.

* ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේ දැයි දැන ගැනීම.
* ව්‍යාපාරයේ මූල්‍ය තත්වය සතුටුදායකද යන්න දැන ගැනීම.
* නීතිමය අවශ්‍යතා ඉටුකිරීම.
  උදා:- සමාගම් පනත අනුව සෑම සමාගමක්ම මාර්තු 31 දිනට ගිණුම් පිළියෙල කිරීම අනිවාර්ය වේ.
* ගනුදෙනු අමතක වීම හා අතපසු වීම ආදිය මගින් සිදුවිය හැකි අවාසි අවම කර ගැනීම
* මූල්‍ය කටයුතු ඉටු කිරීම.